# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1,397/8 – 2005 ජුනි 14 වැනි අඟහරුවාදා – 2005.06.14

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

වයඹ පළාත් සභාව

2004 අංක 03 දරන සුළු වාරි මාර්ග හා ග්‍රාමීය මාර්ග නඩත්තු අරමුදල ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 2004.12.21 වැනි දින සම්මත කරන ලදුව 2005 .05.19 වැනි දින වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළු දෙනාගේම දැන ගැනීම පිණිස සඳහා මෙහි පළ කරමි.

එස්. එම්. ජයතිලක,
සභා ලේකම්,
වයඹ පළාත් සභාව.

2005 ජුනි මස 03 වැනි දින,
කුරුණෑගල,
වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයේ දී ය.

වයඹ පළාතේ පළාත් සභාවේ 2004 අංක 03 දරන සුළු වාරිමාර්ග හා ග්‍රාමීය මාර්ග නඩත්තු අරමුදල ප්‍රඥප්තිය

වයඹ පළාත තුළ පවත්නා සුළු වාරිමාර්ග හා ග්‍රාමීය මාර්ග නියමානුකූලව සහ සුදුසු අවස්ථාවේදී නඩත්තු කිරීම සඳහා අවශ්‍ය අරමුදල් රැස්කිරීම හා බෙදාහැරීම පිණිස වයඹ පළාතේ සුළු වාරිමාර්ග හා ග්‍රාමීය මාර්ග නඩත්තු අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවීමත්, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික හෝ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ ප්‍රඥප්තිය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.


1A—PG 000455 - 520 (2005/06)

**ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.**

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 2004 අංක 03 දරන "සුළු වාරිමාර්ග හා ග්‍රාමීය මාර්ග නඩත්තු අරමුදල ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර, වයඹ පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දිනයේ සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

**වයඹ පළාතේ සුළු වාරිමාර්ග හා ග්‍රාමීය මාර්ග නඩත්තු අරමුදල පිහිටුවීම.**

2. (1) මෙහි මින් මතු අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන "වයඹ පළාතේ සුළු වාරිමාර්ග හා ග්‍රාමීය මාර්ග නඩත්තු අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටවනු ලැබේ.

(2) අරමුදල වයඹ පළාතේ වයඹ පළාත් සභාවේ වාරිමාර්ග විෂයය පැවරෙන පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ භාරයේ පැවතිය යුතුය.

**යටිතල පහසුකම් නඩත්තු කිරීමේ මණ්ඩලය.**

3. (1) අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය මෙහි මින්මතු විධිවිධාන සැලස්වා ඇති ආකාරයට සමන්විත වන "යටිතල පහසුකම් නඩත්තු කිරීමේ මණ්ඩලය" සතු වේ.

(2) මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන යටිතල පහසුකම් නඩත්තු කිරීමේ මණ්ඩලය –

(අ) වයඹ පළාතේ වාරිමාර්ග විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා,
(ආ) වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ,
(ඇ) වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ,
(ඈ) වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ,
(ඉ) වයඹ පළාත් පාලන කොමසාරිස්,
(ඊ) ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ එකඟත්වය ඇතිව පත් කළහැකි වන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික් ප්‍රධානීන්,
(උ) කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්කයන්හි ගොවි සංවිධාන බල මණ්ඩල දෙකෙහි නියෝජිතයන් දෙදෙනෙක්,
(ඌ) වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්,
(එ) රාජ්‍ය නොවන සංවිධාන දෙකක නියෝජිතයන් දෙදෙනෙක්,
(ඒ) වයඹ පළාතේ වෙළඳ සංවිධානයක නියෝජිතයෙක්,
(ඔ) වයඹ වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්
යන අයගෙන් සමන්විත විය යුතු වේ.

(3) වයඹ පළාතේ වාරිමාර්ග විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන් මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු වේ.

(4) ග්‍රාමීය දිළිඳුභාවය තුරන් කිරීමේ සඳහා යටිතල පහසුකම් නඩත්තු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලය තුළ දී එම ව්‍යාපෘතියේ අධ්‍යක්ෂවරයා ද, ව්‍යාපෘතිය නිම කිරීමෙන් ඉක්බිතිව යටිතල පහසුකම් නඩත්තු කිරීමේ ඉංජිනේරුවරයා ද මණ්ඩලයේ ලේකම් වශයෙන් කටයුතු කළ යුතු වේ.

**මණ්ඩලයේ සාමාජිකයන් පත්කිරීම සහ ධුරකාලය.**

4. (1) (අ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලය තුළ දී වයඹ පළාතේ ප්‍රධාන ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනය හෝ එම විෂයයන් අයත් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ද,

(ආ) ව්‍යාපෘති කාලය නිමවීමෙන් පසු,

වයඹ පළාතේ පළාත් සභාවේ වාරිමාර්ග විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත වයඹ පළාතේ ප්‍රධාන ලේකම්වරයා විසින් ද,

මණ්ඩලයේ සාමාජිකයන් පත් කළ යුත්තේ ය.

42 (2) ඉහත 3 (2) වගන්තියේ සඳහන් යටිතල පහසුකම් නඩත්තු කිරීමේ මණ්ඩලයේ සාමාජිකයකුගේ ධුර කාලය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කාලය තුළ දී වසර තුනකට ද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමෙන් අනතුරුව වසර දෙකක කාලයක් සඳහා ද වන පරිදි ඉහත 4 (1) වගන්තියේ සඳහන් බලධාරීන් විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.

(3) නිල තත්ත්වය මත පත් කරනු ලබන සාමාජිකයෙකු හැර වෙනත් කවර හෝ සාමාජිකයකු වෙත ප්‍රදානය කරන ලද පත්වීමක් යථා පරිදි නොදරන බවට හෝ එම තනතුර දැරීම හානිකර යයි පත්වීම් බලධාරියාට ඒත්තු යන ඕනෑම අවස්ථාවක හේතු දක්වා එම ධුරයෙන් ඉවත් කිරීමට පත්වීම් බලධාරියාට පූර්ණ බලය ඇත්තේ ය.

(4) නිල තත්ත්වය මත පත් කරන ලද සාමාජිකයකු එම නිලය දැරීම අවසන්වීමත් සමගම ඔහුගේ සාමාජිකත්වය අහෝසිවන අතර, අනුප්‍රාප්තික තැනැත්තා ඉතිරි සාමාජික කාලය සඳහා පත් කළ යුත්තේ ය.

(5) පත් කිරීමේ බලධාරියා වෙත ඉදිරිපත් කෙරෙන ලිඛිත ඉල්ලීමක් මගින් නිල තත්ත්වය මත පත් කරන ලද සාමාජිකයකුට හැර වෙනත් ඕනෑම සාමාජිකයෙකුට සිය සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමට අවකාශ ඇත්තේ ය.

(6) සාමාජිකයකු ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් ඇතිවන පුරප්පාඩුවක් සඳහා නැවත පත් කරනු ලබන තැනැත්තකුගේ ධූර කාලය, පූර්ව සාමාජිකයා පත් කරන ලද ධූර කාලයෙන් ඉතිරි කාලයට සීමා විය යුතුය.

(7) මණ්ඩලයේ ගනපූරණය හයක් විය යුතු අතර, එයින් දෙදෙනෙකු නිල බලයෙන් පත්වූවන් විය යුතු ය.

5\. (1) අරමුදල නමින් වෙනම බැංකු ගිණුමක් රාජ්‍ය බැංකුවක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් පවත්වාගෙන යා යුතු අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමෙන් අනතුරුව අරමුදලේ බැංකු ගිණුම වාරිමාර්ග විෂය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වාගෙන යා යුත්තේ ය. අරමුදලේ ගිණුම.

(2) අරමුදලට,

*(අ)* ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාල සීමාව තුළ දී, ව්‍යාපෘතිය විසින් නඩත්තු කිරීම සඳහා තෝරාගනු ලබන සුළු වාරිමාර්ග ව්‍යාපාර වෙනුවෙන් දිළිඳුකම පිටුදැකීමේ ජපන් අරමුදල, ශ්‍රී ලංකා ආණ්ඩුව සහ අදාළ ගොවි සංවිධාන ද ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කාලයෙන් අනතුරුව ශ්‍රී ලංකා ආණ්ඩුව සහ අදාළ ගොවි සංවිධාන විසින් ලබාදෙන මුදල් ද,

*(ආ)* ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලසීමාව තුළ දී ව්‍යාපෘතිය විසින් නඩත්තු කිරීම සඳහා තෝරා ගනු ලබන ග්‍රාමීය මාර්ග වෙනුවෙන් දිළිඳුකම පිටුදැකීමේ ජපන් අරමුදල සහ ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ලබාදෙන මුදල් ද, ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කාලයෙන් අනතුරුව ශ්‍රී ලංකා ආණ්ඩුව, වයඹ පළාත් සභාව සහ ප්‍රාදේශීය සභා විසින් ලබාදෙන මුදල් ද,

*(ඇ)* වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබිය හැකි දීමනා, ප්‍රදානයන්, තෑගි වශයෙන් හෝ අන්‍යාකාරයකින් ලැබෙන මුදල් ද,

බැර කළ හැක්කේ ය:

6\. *(අ)* ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කාලය තුළදී සුළු වාරිමාර්ග සම්බන්ධයෙන් සකස් කරනු ලබන වාර්ෂික නඩත්තු ඇස්තමේන්තු මුදලින් 40% ක් දිළිඳුකම පිටුදැකීමේ ජපන් අරමුදල් ද, 10% ක් ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් ද, 50% ක් අදාළ ගොවි සංවිධානය ද විසින් දෙනු ලබන මුදල් ද වන සේ හා, ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කාලයෙන් අනතුරුව ශ්‍රී ලංකා ආණ්ඩුවේ අරමුදලින් 10% ක් ද, ගොවි සංවිධාන විසින් දෙනු ලබන මුදලින් 90% ක් ද, වශයෙන් වූ ප්‍රතිශතයනට සමාන මුදල් ප්‍රමාණයක් අරමුදලින් වැය කිරීමට ද, මුදල් යෙදවීම.

*(ආ)* ග්‍රාමීය මාර්ග සම්බන්ධයෙන් වන විට දී ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කාලය තුළ දී ව්‍යාපෘති අධ්‍යක්ෂ සකස් කරනු ලබන වාර්ෂික නඩත්තු ඇස්තමේන්තු මුදලින් 1 වන, 2 වන හා 3 වන වර්ෂවල දී පිළිවෙලින් 50%, 40% හා 20%ක් දිළිඳුකම පිටුදැකීමේ ජපන් අරමුදලින් ද, 50%, 60% හා 80% වශයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදලින් ද,ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කාලයෙන් අනතුරුව ශ්‍රී ලංකා ආණ්ඩුවේ අරමුදලින් 100% ක් ද, වශයෙන් වූ ප්‍රතිශතයනට සමාන වූ මුදලක් අරමුදලින් වැය කිරීමට ද,

*(ඇ)* ව්‍යාපෘතිය විසින් තෝරාගනු ලබන සුළු වාරිමාර්ග හා ග්‍රාමීය මාර්ග ව්‍යාපාරයන්හි ප්‍රමුඛතා නඩත්තු කටයුතු වෙනුවෙන් පිළියෙල කරනු ලබන ඇස්තමේන්තුවල සඳහන් මුදලින් 45%ක් දිළිඳුකම පිටුදැකීමේ ජපන් අරමුදලින් ද, 55%ක් ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදලින්, වැය කිරීමට ද,

*(ඈ)* ලිත් වර්ෂය අවසානයේ ශ්‍රී ලංකා රජය විසින් ලබාදෙනු ලැබූ මුදලින් ඉතිරි මුදලක් වේ නම්, එම මුදල් ශ්‍රී ලංකා ආණ්ඩුව වෙත ආපසු යැවීමට ද,

කටයුතු කළ යුතු වන්නේ ය.

**යටිතල පහසුකම් නඩත්තු කිරීමේ ඒකකය**

7. (1) ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලය තුළ දී, අරමුදලේ කාර්යයන් හා අරමුදල් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් ඉටු කළ යුතු අතර. ව්‍යාපෘති කාලයෙන් අනතුරුව අරමුදලේ එකී කාර්යයන් හා අරමුදල් ඉටු කිරීම සඳහා පහත සඳහන් තනතුරුවලින් සමන්විත ග්‍රාමීය යටිතල පහසුකම් නඩත්තු කිරීමේ ඒකකයක්, වයඹ පළාතේ වාරිමාර්ග විෂය පැවරෙන පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයා යටතේ ස්ථාපිත කළ හැක්කේ ය.

| තනතුරු නාමය | තනතුරු ගණන |
|---|---|
| ග්‍රාමීය යටිතල පහසුකම් නඩත්තු කිරීමේ ඉංජිනේරු | 01 |
| සමාජ ආර්ථික විද්‍යාඥ | 01 |
| ගණකාධිකාරී | 01 |
| කාර්මික සහකාර | 03 |
| ලිපිකරු | 03 |
| ලඝුලේඛක/පරිගණක ක්‍රියාකරු | 01 |
| සැලසුම් ශිල්පී | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| රියැදුරු | 01 |

**මණ්ඩලයේ සාමාජිකයනට දීමනාවක් ගෙවිය හැකි බව.**

8. යථා පරිදි පත් කළ යටිතල පහසුකම් නඩත්තු කිරීමේ මණ්ඩලයේ සභාපතිවරයාට හා සාමාජිකයනට මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගීවීම වෙනුවෙන් වයඹ පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය නිශ්චය කරනු ලබන දීමනාවක් ගෙවිය හැක්කේ ය.

**අරමුදලේ ගිණුම් සහ විගණනය.**

9. (1) අරමුදලේ සියලු ආදායම් සහ වියදම් පිළිබඳ ගිණුම් පවත්වා ගැනීම ව්‍යාපෘති කාලසීමාව තුළ දී ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ද, ව්‍යාපෘති කාලයෙන් අනතුරුව වයඹ පළාතේ වාරිමාර්ග විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ද කළ යුතු ය.

(2) රජයේ විගණකාධිපතිවරයා විසින් අරමුදලේ ගිණුම් විගණනය කළ යුත්තේ ය.

**අමාත්‍යවරයා විසින් නියෝග පැනවිය හැකි බව.**

10. (1) මණ්ඩලයේ බලතල, වගකීම්, කාර්යයන් ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හා බලගැන්වීම සඳහා සම්බන්ධිත හෝ අනුෂාංගික වූ කිසියම් කරුණක් සම්බන්ධයෙන් අවශ්‍ය වන නියෝග පැනවීමට අමාත්‍යවරයාට හැකි ය. එකී නියෝග *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළකළ යුතු අතර එසේ පළකරනු ලැබූ දින සිට හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් වන දිනක සිට හෝ ඒ නියෝග ක්‍රියාත්මකවිය යුත්තේ ය.

(2) එසේ පළ කිරීමෙන් පසුව හැකිතාක් ඉක්මණින් එකී නියෝග අමාත්‍යවරයා විසින් පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු අතර, සභාව විසින් එකී නියෝග අනුමත කිරීම හෝ යම් සංශෝධනයක් හෝ පරිච්ඡින්න කිරීමක් හෝ කරනු ලැබිය හැක.

(3) එකී පරිච්ඡින්න කිරීම හෝ සංශෝධනය කිරීම *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු අතර, එකී පළ කිරීමේ දින සිට එහෙත් ඒ දිනයට පෙරාතුව එකී නියෝග යටතේ කරනු ලැබ තිබිය හැකි යම් දෙයකට හෝ ආරම්භ කර තිබිය හැකි යම් නීති කෘත්‍යයකට හානියක් නොමැතිව බලපෑ යුතු ය.

**අර්ථ නිරූපනය.**

11. මෙම ප්‍රඥප්තියෙහි,

"සභාව" - යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාව ද,
"අමාත්‍යවරයා" - යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ වාරිමාර්ග විෂයය භාර අමාත්‍යවරයා ද,
"රාජ්‍ය බැංකුව" - යන්නෙන් ලංකා බැංකුව හා මහජන බැංකුව ද

අදහස්කෙරේ.

**අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.**

12. මෙම ප්‍රඥප්තියෙහි සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පාඨ අතර යම් අනුකූලතාවක් ඇති වුවහොත්, සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

07-26

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.